# මලිදෙව් පුවත්®

මලියදෙව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රකාශනයකි



# නිවාසාන්තර ක්‍රීඩා උත්සවය 2025

ක්‍රීඩා උත්සවය සඳහා ප්‍රධාන අනුග්‍රහය
මලියදෙව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය



# උඩවත්ත
PAPERS


037 22 26 740
10/15 සර්වෝදය මාවත
රජපිහිල්ල පාර කුරුණෑගල

# මලියදේව විද්‍යාලයීය
# නිවාසාන්තර ක්‍රීඩා උත්සවය

විද්‍යාලයීය කීර්තිමත් ආදි ශිෂ්‍ය
ශ්‍රී ලංකා යුද හමුදාවේ 56 වන සේනාංකයේ සේනාධිපති

**මේජර් ජෙනරාල් කේ.එන්.ඩී. කරුණාපාල RSP ndu**

මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්

විද්‍යාලයීය කීර්තිමත් ආදි ශිෂ්‍ය
මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්

**එස්.එම්.පී. සූරියබණ්ඩාර**

මැතිතුමාගේ සහභාගීත්වයෙන්

**2025 මාර්තු මස 12 වන දින**
**ප.ව. 12.30 ට**
**විද්‍යාලයීය ක්‍රීඩාංගණයේදී පැවැත්වේ.**

## ක්‍රීඩක ප්‍රතිඥාව

වර්ෂ 2025 ක් වූ මාර්තු මස 12 වන බදාදා දින

මලියදෙව විද්‍යාලයේ සිසුන් වන අපි

තිස්ස, ගැමුණු, පරාක්‍රම හා රාජසිංහ යන

නිවාස 4 කට බෙදී

විද්‍යාලයේ ගෞරවයත්

ක්‍රීඩාවේ උත්තරීතරභාවයත්

ආරක්ෂා කර ගනිමින්

තරඟ නීතිරීති වලට අනුකූලව

තරඟ වදින බවට

ගෞරව බහුමානයෙන් යුතුව ප්‍රතිඥා දෙමු.

# ප්‍රධාන ආරාධිත අමුත්තාගේ පණිවිඩය



මලියදෙව විද්‍යාලයේ ගෞරවනීය විදුහල්පතිතුමා, ආරාධිත අමුත්තන්, ආදිශිෂ්‍ය සංගමයේ සාමාජිකයින්, ආදරණීය සිසුන් හා දෙමාපියන් ඇතුළු මලියදෙව විද්‍යාලයේ සම්භාවනීය සාමාජිකයිනි.

වාර්ෂික ක්‍රීඩා උළෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අද මම ඔබ හමුවේ පෙනී සිටින්නේ ඉමහත් ආඩම්බරයෙන් සහ අභිමානයෙන් යුතුවයි. අපේ දේශයේ තරුණ මනස හැඩගස්වාලීම සඳහා මුල් ආරම්භය ලෙස අප ගුරු දෙගුරුන්ගේ අප්‍රතිහත කැප කිරීම තුලින් ඔවුන්ගේ දැනුම, ශක්තිය හා විනය ගරුකභාවයෙන් යුත් වැඩදායි පුද්ගලයකු ලෙස රටට දායාද කල මේ අභිමානවත් මලියදෙව් මැණියන් හට ගෞරව පිරිනැමීමට ලැබීම මා ලද මහත් භාග්‍යයක් ලෙස සලකමි.

මලියදෙවයේ වීර පුත්‍රයින් රැසක් අභියෝගාත්මක කාල වලදී අපේ මාතෘ භූමිය ආරක්ෂා කිරීමට පරාර්ථකාමී පරිත්‍යාගයන් කර ඇති අතර, එය විද්‍යාලයෙන් ඇති කළ ශක්තිමත් පසුබිම සහ කැපවීම පිළිබිඹු කරයි. ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය කරන සාඩම්බර 'දේවන්' කෙනෙකු ලෙස මලියදේව විද්‍යාලයෙන් ඇති කළ ප්‍රතිපත්ති සහ සාරධර්ම ඉදිරියට රැගෙන යාමට ලැබීම මම ගෞරවයක් සේ සලකමි.

ඔබ මෙහිදී ලබා ගන්නා දැනුම, විනයගරුකභාවය, අවංකභාවය, සහ කැපකිරීම කිසිදා අත් නොහරින සෙවනැල්ලක් මෙන් ඔබගේ මතු දියුණුවටත් නායකයකු ලෙස ඔබ උපන් දේශයට සේවය කිරීමට සහ දේශයේ පුරවැසියකු ලෙස රටට වැඩදායි පුද්ගලයකු බවට පත්වීමට උපකාරීවනු ඇත.

රටට දේශයට වැඩදායි පුද්ගලයන් හැඩගැස්වීමේදී ක්‍රිඩාව ප්‍රධාන කාර්යක් ඉටු කරන අතර, ක්‍රිඩාව තුලින් ශාරීරික යෝග්‍යතාවය, මානසික ශක්තිය හා විනය ගරුකභාවය ඉතා ඉහල තලයකට ඔප්නැංවීමට අවශ්‍යය කරන මූලික අඩිතාලම ලැබෙන අතර, ඒ තුලින් ඉස්මතු වන සමගිය ක්‍රියාශීලිත්වය හා සුහදත්වය මනා ලෙස පෝෂණය වීමෙන් පසු ජය පරාජය හමුවේ නොබියව නොසැලී දරාගැනීමට ශක්තිය හා ධෛර්ය ක්‍රිඩාව තුලින් ඔබට ලැබෙනු ඇත.

මෙම මලල ක්‍රීඩා උත්සවය සිසුන්ට ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා ප්‍රදර්ශනය කිරීමට, අවස්ථාවක් වන අතර, එහිදී ඔබ ජයග්‍රහණය කරන විට කරුණාවන්ත වීමටත් පරාජය හමුවේ ඉතා ඉවසිලිවන්ත වීමටත් ජයපරාජය එක්සිතින් භාර ගැනීමට අධිශ්ඨානශීලීව කටයුතු කල යුතු අතර, එය ඔබගේ මිතුරන් සමග ගතකල ජීවිතේ සදාකාලික මතකයන් නිර්මාණය කරන අවස්ථාවක් වේ.

අද දින තරග වදින සෑම 'දේවන්' ක්‍රිඩකයකුටම මගේ හදපිරි සුභපැතුම් පිරිනමන අතර, මෙහි කොටස්කරුවකු වීම ගැන ඔබ මහත් සේ ආඩම්බර විය යුතුය. පාසල තුලින් ලබාගත් ධනාත්මක සිතුවිලි සහ උපදේශන තුලින් ඔබව නව මගකට යොමු වීමත් ඒ තුලින් ඔබගේ කැපවීම, සමුහිකත්වය හා ක්‍රියාශීලිත්වය හමුවේ වසර 137ක අභිමානවත් ඉතිහාසයක් හෙබි මලියදේව විද්‍යාලීය කීර්ති නාමය තව තවත් ඔප්නැංවීමට ශක්තිය ධෛර්ය ලැබේවායි මා එක් සිතින් ප්‍රර්ථනා කරමි !

**මේජර් ජෙනරාල් කේ.එන්.ඩී. කරුණාපාල RSP ndu**

## විශේෂ ආරාධිත අමුත්තාගේ පණිවිඩය



21 වන සියවසයට උචිත පූර්ණ පෞරුෂයක් සහිත පුරවැසියන් බිහි කිරීමේ උදාරතර වූ කාර්ය භාරයට සමස්ත පාසල් පද්ධතියට උරදෙන මෙවන් යුගයක හස්ති ශෛලපුරවරයේ සියලුම පාසල් අතර දිදුලන මිණිපහනක් බඳු වූ මලියදෙව විද්‍යාලයේ 2025 වර්ෂයේ වාර්ෂික නිවාසාන්තර උත්සවයට සුභ පැතුම් පණිවිඩයක් එක් කිරීමට ඉඩ හසර ලැබීමත් මා මලිදෙව් විදු මවගේ සෙවනේ හැදී වැඩුණ ආදී පුත්‍රයකු වීමත් සිහිපත් කරනුයේ ඉතාමත් සන්තෝෂයෙනි.

වසර 137 ක සාඩම්බර සංවත්සර අතීතයක සිටම මලිදෙව් දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍යය ඔප් නංවීම සඳහා පාසලක් තුළ පවත්වනු ලබන උත්සව අතරින් අභිමානවත් වූ උත්සවය වන්නේ නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයයි. එකම පාසලේ දරුවන් නිවාස හතරකට බෙදෙමින් තම තමන්ගේ ක්‍රීඩා කෞශල්‍යය උරගා බැලීමටත් දක්ෂතාවයන් ඔප් නැංවීමටත් ලැබෙන සුවිශේෂී අවස්ථාවක් ලෙස පෙන්වාදීමට හැකිය.

එමෙන්ම දරුවන්ගේ විනය සහයෝගීතාවය, නායකත්වය, ගෞරවසම්පන්න වූ අභිමානය සහ ජයග්‍රහණයේ සතුට දරා ගැනීමටත් පරාජයේ වේදනාව සමසේ විඳගැනීමටත් දරුවන්ට ලබා දෙන්නාවූ මහඟු අවස්ථාවක් වනු ඇත. ඒ වාගේම සෑම දරුවකුටම පාසලේ පැවැත්වෙන මලල ක්‍රීඩා උත්සවයේදී කුමන හෝ ක්‍රීඩාවකින්, කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් හෝ තම ජීවිතයට අත්‍යවශ්‍ය වූ සෞඛ්‍යයමත් බව මෙමගින් ලබාගැනීමට අවස්ථාව සැලසී ඇත. මෙම අනගි අවස්ථාව දරුවන්ගේ අනාගත දිවියේ ආදරණීය වූ සදාකාලික සිහවටන බවට පත් වේ.

මෙම ක්‍රීඩා උලෙළ සඳහා අවස්ථාව මලිදෙව් දරුවන්ට ලබා දුන් ගරු විදුහල්පතිතුමා සහ නන් අයුරින් දායක වූ සැමට මාගේ හෘදයාංගම ස්තූතිය පිරිනමන අතර මෙම නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවය අතිශය සාර්ථක උත්සවයක් වේවා යන්න මාගේ ප්‍රාර්ථනයයි. ඒ වගේම මලිදෙව් අභිමානය දූයට හඬ ගා කීමට දරුවන්ගේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය හේතු වේවා කියා හදවතින්ම මම ප්‍රාර්ථනා කරමි.

**ඉංජිනේරු. එස්.එම්.පී. සුරියබණ්ඩාර**
අධ්‍යක්ෂ ජනරාල්
මාර්ග සංවර්ධන අධිකාරිය

# මලියදෙව විද්‍යාලයීය ගරු විදුහල්පතිතුමාගේ පණිවිඩය



2025 මලියදෙව විද්‍යාලයීය වාර්ෂික ක්‍රීඩා උත්සවය වෙනුවෙන් ක්‍රීඩාවේ නියැලෙන දරුවන් ඇතුළු සමස්ත ප්‍රජාව වෙත පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

සමාජයට අති විශිෂ්ටයෙකු බිහි කළ හැකි වන්නේ අධ්‍යාපනය හා ක්‍රීඩාව සමබර ලෙස පවත්වා ගනිමින් ඔවුන්ගේ කායික හා මානසික මෙන්ම සාමාජීය අංශයන් ජය ගැනීමට හැකි අයෙකු සමාජගත කිරීමෙනි. ක්‍රීඩාව තුළින් ශිෂ්‍ය පෞරුෂය සංවර්ධනයට ලැබෙන්නේ නොමඳ පිටුවහලකි. එමගින් ඉදිරිපත්වීම, ජය පරාජය විඳ දරා ගැනීම, සහයෝගය, එකමුතුකම ආදී පෞරුෂ ගුණාංග දියුණු කර ගැනීමට ශිෂ්‍යයන්ට හැකියාව ලැබීම මෙවන් ක්‍රීඩා උත්සවයක් පවත්වා ඔවුන් ඇගයීම තුළින් ලැබෙනු ඇත.

විද්‍යාලය පවත්වන වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා තරගවලින් මුල්වරට එළි දක්වන අංකුර ක්‍රීඩකයන් කොට්ඨාස, කලාප, පළාත්, ජාතික හා ජාත්‍යන්තර තලයන් ඔස්සේ ඉහළට ඔසවා තබන්නේ ක්‍රීඩා භාර ගුරුවරුන් හා පුහුණුකරුවන් විසිනි. මෙම කාර්යයේ දී කැපවී ක්‍රියා කරන ඔවුන්ටත්, නියෝජ්‍ය විදුහල්පති (ක්‍රීඩා හා විෂය සමගාමී) උපුල් ගුණතිලක මහතාටත්, ක්‍රීඩා පාලක අකලංක ගමගේ මහතා ඇතුළු ගුරුවරුන් හා දෙමාපියන්ටත් ස්තූතිවන්ත වෙමි. නිබඳවම වාර්ෂික ක්‍රීඩා උත්සවය සාර්ථක කර ගැනීමෙහි ලා මූල්‍යමය සහයෝගය දෙමින් කටයුතු කරන විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයටත් පාසල් සංවර්ධන සමිතියටත් ස්තූතිවන්ත වෙමි.

**ඩබ්.එම්.සී.කේ. මහමිතව**
විදුහල්පති

# ආදි ශිෂ්‍ය සංගමයේ ගරු ක්‍රියාකාරී සභාපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ප්‍රෞඪ රාජධානී සතරකට උරුමකම් ලත් සත්කෝරළයේ මහා පහන් ටැඹ සේ දිදුළන මලියදේව විද්‍යාලයේ 2025 වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරී සභාපති ලෙස සුභ පැතුම් එක් කිරීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙමි.

එසුගිය වසර 137 ක් පුරාවට අප විද්‍යාලය අධ්‍යාපන, ක්‍රීඩා, විෂය සමගාමී හා විෂය බාහිර කටයුතු වලින් දිවයිනේ ප්‍රමුඛතම විද්‍යාලයක් ලෙස කීර්තියක් උසුලයි. එවන් මලිදෙව් මාතාවගේ වත්මන් පුතුන් සතු හැකියාවන් දක්ෂතා බවට පත්කොට ප්‍රදර්ශනය කරන ප්‍රධානතම අවස්ථාව නිවාසාන්තර ක්‍රීඩා උත්සවයයි. එසේම පාසැලේ සමස්ත දරු පිරිසම සහභාගී වන ප්‍රධානතම උත්සවය ද මෙය වේ. මෙම දක්ෂතා දැක්වීම සඳහා මූලික අඩිතාලම, වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා තරග තුළින් සිසු දරුවන් වෙත ලැබෙන අතර, එහිදී ගන්නා පන්නරය දරුවන්ගේ ඉදිරි ජයග්‍රහණයන්ට ඉමහත් පිටුවහලක් වනු ඇත.

ක්‍රීඩාවේ ජය පරාජය භාරගෙන ක්‍රීඩාවේ ජීව ගුණය ආරක්ෂා කරගනිමින් එකම සහෝදර කැළක් සේ එක්ව තරග කරමින් පවත්වන වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය අප විද්‍යාලයේ අභිමානය විදහාලන තවත් එක් අංගයක් ලෙස සලකනු ලැබේ.

මලිදෙව් පුතුන්ගේ ක්‍රීඩා කෞශල්‍යය ඔප්නංවනු සඳහා සෑම වර්ෂයකම මෙන්ම මෙම වර්ෂයේ දීද මලියදෙව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සඳහා ප්‍රධාන අනුග්‍රාහකත්වය දක්වයි. ඒ සඳහා ආසන්න වශයෙන් රුපියල් මිලියන 2 ක පිරිවැයක් ආදි සිසුන් සතුටින් දරනු ලබන්නේ වත්මන් දරුවන්ගේ ක්‍රීඩා දක්ෂතා සංවර්ධනය පිණිසයි. මේ අතර, ආදි ශිෂ්‍ය සංගමය මලියදේව විද්‍යාලයේ අධ්‍යාපන, ක්‍රීඩා, විෂය සමගාමී හා විෂය බාහිර කටයුතු සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 40 කට ආසන්න පිරිවැයක් දරන්නේ ද ඉහත අරමුණු පෙරදැරි කරගෙනය. මේ සඳහා ආදි සිසුන්, සුබ පතන්නන් මෙන්ම මව් ආදි ශිෂ්‍ය සංගමය ද, අනු කණ්ඩායම් ද, දක්වන ලද දායකත්වය ඉතා විශිෂ්ටයි.

2025 වාර්ෂික නිවාසාන්තර ජවන හා පිටිය මලල ක්‍රීඩා උත්සවය සාර්ථක වේවායි ප්‍රර්ථනා කරමින් මාගේ සුබ පැතුම් පිරිනමමි.

**සමන් ජයසිංහ**
ක්‍රියාකාරී සභාපති, මලියදේව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය

# ක්‍රීඩා හා විෂය සමගාමී නියෝජ්‍ය විදුහල්පතිතුමාගේ පණිවිඩය



මලියදෙව විද්‍යාලයීය අභිමානවත් 137 වන සංවත්සරය සමරන මෙම අවස්ථාවේ වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සංවිධානය කරනු ලබන්නේ මහත් අභිමානයෙනි.

දරුවන්ගේ ආකල්ප සහ කුසලතා සංවර්ධනය වීමට අත්‍යාවශ්‍ය වන නීරෝගී ශාරීරික හා මානසික සෞඛ්‍යයක් ඇති කළ හැකි වන්නේ ක්‍රීඩාවෙනි. ක්‍රීඩාව තුළින් බිහි වන ක්‍රියාශීලී ජවසම්පන්න මලිදෙව් පුතුන් දේශයට ශක්තියකි. එවන් පුතුන් බිහි කිරීමට මලියදෙව විද්‍යාලයීය සියලුම ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන ප්‍රධානතම උත්සවය වන වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය තුළින් මලියදේවයට ආවේණික වූ සම්ප්‍රදායන් මතු පරපුර වෙත දායාද කරමින් මෙවර නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සංවිධානය වී ඇත.

වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය සාර්ථකත්වය වෙනුවෙන් සක්‍රිය දායකත්වය ලබා දෙමින් කැපවීමෙන් කටයුතු කළ මලිදෙව් පුතනුවන් සහ නිවාස භාර ආර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන්, ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන ගුරුභවතුන්, සංදර්ශන පුහුණු කිරීම් සිදුකළ ආචාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ගේ කැපවීම මත අලංකාරවත් ක්‍රීඩා උත්සවයක් පැවැත්වීමට හැකියාව ලැබිණි.

වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය මැනවින් සංවිධානයට සහයෝගය දැක්වූ විද්‍යාලයීය කළමනාකරණ මණ්ඩලය සහ අචාර්ය මණ්ඩලයටත්, පාසල් සංවර්ධන සමිතිය සහ මලියදෙව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ නිලධාරීන් සහ සාමාජිකත්වය දක්වන ලද දායකත්වය බෙහෙවින් අගය කරමි.

2025 ක්‍රීඩා උත්සවයේ ජයග්‍රාහකයින් අතුරින් ජාතික මට්ටමේ ක්‍රීඩකයින් බිහි වේවායි පතමි.

**එච්.එම්.යූ.එන්. ගුණතිලක**
නියෝජ්‍ය විදුහල්පති (ක්‍රීඩා හා විෂය සමගාමී)

## ක්‍රීඩා පාලකතුමාගේ පණිවිඩය



වසර 137 ක කීර්තිමත් ඉතිහාසයක් ඇති මලියදෙව විද්‍යාලයීය වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය වෙනුවෙන් සුබපැතුම් එක් කරනුයේ හදපිරි සතුටිනි.

කීර්තිමත් හා අභිමානවත් සාඩම්බර උරුමයක් හිමි මලියදෙව විද්‍යාලය, ස්වකීය කිතුගෙස ලොවට විදහා දක්වන අභිමානවත් අවස්ථාව ලෙස සහ මලිදෙව් දරුවන්ගේ හැකියා හා දක්ෂතා ඉදිරිපත් කිරීමට අවස්ථා සලසන ප්‍රධානතම අංගය ලෙස වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය හැඳින්විය හැකිය.

මෙම වාර්ෂික ක්‍රීඩා උත්සවය මැනවින් සංවිධානය කිරීම සඳහා දායක වූ විදුහල්පතිතුමා ප්‍රමුඛ විද්‍යාලයීය කළමනාකරණ මණ්ඩලය විශේෂයෙන් සිහිපත් කළ යුතුය. එමෙන්ම විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය, විනිසුරුවන්, පුහුණුකරුවන් සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත් දින ගණනාවක් මුළුල්ලේ වෙහෙස මහන්සි වී කටයුතු කළ විද්‍යාලයේ සියලු සිසු දරුවන්ටත් නන් අයුරින් සහය දැක්වූ සැමටත් මාගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

මෙම දැවැන්ත කාර්යය සංවිධානය කිරීමේ දී ප්‍රධාන අනුග්‍රාහක දායකත්වය සපයන මලියදෙව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ගරු සභාපතිතුමා ඇතුළු සියලුම නිලධාරීන්ට මාගේ ස්තූතිය ප්‍රාකශ කරමි. එමෙන්ම පාසල් සංවර්ධන සමිතියේ නිලධාරී මණ්ඩලයට ද ස්තූතිය ප්‍රකාශ කර සිටිමි. එසේම මෙම අවස්ථාවට සක්‍රීය දායකත්වය දැක්වූ විද්‍යාලයීය දරුවන්ට සුබ පතමින් වාර්ෂික ක්‍රීඩා උත්සවය සාර්ථක වේවායි සුභාසිංශනය කරමි.

**අකලංක ගමගේ**
ක්‍රීඩා පාලක

## වැඩසටහන් පෙළගැස්ම

| | | |
|---|---|---|
| **ප.ව. 12.30** | - | විශේෂ ආරාධිත අමුත්තා ක්‍රීඩා පිටියට කැඳවාගෙන ඒම |
| **ප.ව. 12.40** | - | ක්‍රීඩා ධජය ක්‍රීඩා පිටියට රැගෙන ඒම |
| **ප.ව. 12.45** | - | ධජ එසවීම හා ජාතික ගීය ගායනා කිරීම |
| **ප.ව. 12.50** | - | ඔලිම්පික් පහන දැල්වීම |
| **ප.ව. 12.55** | - | ක්‍රීඩා ප්‍රතිඥාව කියවීම හා ක්‍රීඩකයින් විසිර යාම |
| **ප.ව. 01.00** | - | විනිසුරු ප්‍රකාශය |
| **ප.ව. 01.02** | - | ක්‍රීඩා උත්සවයේ ආරම්භක ප්‍රකාශය |
| **ප.ව. 01.05** | - | විනිශ්චය මණ්ඩලය හඳුන්වා දීම |
| **ප.ව. 01.10** | - | වයස 11 න් පහළ මීටර් 100 (20,22,21,54,01,03,39,02) ජය සංකේත ප්‍රදානය |
| **ප.ව. 01.15** | - | වයස 12 න් පහළ මීටර් 100 (40,04,23,55,41,24,25,42) ජය සංකේත ප්‍රදානය |
| **ප.ව. 01.20** | - | වයස 13 න් පහළ මීටර් 100 (27,57,07,05,43,56,06,26) ජය සංකේත ප්‍රදානය |
| **ප.ව. 01.25** | - | වයස 14 න් පහළ මීටර් 100 (59,58,28,44,29,30,08,09) ජය සංකේත ප්‍රදානය |
| **ප.ව. 01.30** | - | වයස 20 න් පහළ මීටර් 100 (37,64,52,19,17,38,18,53) ජය සංකේත ප්‍රදානය |
| **ප.ව. 01.35** | - | වයස 15 න් පහළ මීටර් 200 (45,12,10,60,61,11,46,27) ජය සංකේත ප්‍රදානය |
| **ප.ව. 01.45** | - | වයස 16 න් පහළ මීටර් 200 (33,14,34,32,13,48,47,62) ජය සංකේත ප්‍රදානය |
| **ප.ව. 01.55** | - | වයස 18 න් පහළ මීටර් 200 (15,16,63,35,49,36,51,50) ජය සංකේත ප්‍රදානය |
| **ප.ව. 02.05** | - | 1 සහ 2 ශ්‍රේණි වල විවිධ ඇඳුම් සංදර්ශනය සහ නිවාස පරීක්ෂාව |
| **ප.ව. 02.15** | - | විවේක කාලය |
| **ප.ව. 02.30** | - | ප්‍රධාන අමුත්තාගේ පැමිණීම (පෝතක, ජ්‍යෙෂ්ඨ, බාලදක්ෂ ආචාරය) |

**ප.ව. 02.45** - අපරදිග තූර්යවාදක සංදර්ශනය

**ප.ව. 02.52** - පෙරදිග තූර්යවාදක සංදර්ශනය

**ප.ව. 03.00** - වයස 13 න් පහළ මීටර් 100×4 (P,T,G,R)

**ප.ව. 03.05** - වයස 14 න් පහළ මීටර් 100×4 (P,G,T,R)

**ප.ව. 03.10** - වයස 15 න් පහළ මීටර් 100×4 (P,T,R,G)

**ප.ව. 03.15** - වයස 16 න් පහළ මීටර් 100×4 (G,T,P,R)

**ප.ව. 03.20** - වයස 18 න් පහළ මීටර් 100×4 (T,R,G,P)

**ප.ව. 03.25** - වයස 20 න් පහළ මීටර් 100×4 (R,T,G,P)

**ප.ව. 03.30** - සණ සරඹ සංදර්ශනය

**ප.ව. 03.40** - කඹ ඇදීමේ තරඟය

**ප.ව. 03.50** - ආරාධිත පාසල් සහාය තරඟය

**ප.ව. 04.00** - අධ්‍යයන කාර්යය මණ්ඩල තරඟය

**ප.ව. 04.10** - අනධ්‍යයන කාර්යය මණ්ඩල තරඟය

**ප.ව. 04.15** - ආදි ශිෂ්‍ය තරඟය

**ප.ව. 04.20** - සරඹ සංදර්ශනය (කණිෂ්ඨ අංශය)

**ප.ව. 04.30** - ආචාර පෙළපාලිය

**ප.ව. 04.40** - පිළිගැනීමේ කතාව (විදුහල්පතිතුමා)

**ප.ව. 04.45** - විශේෂ ආරාධිත අමුත්තාගේ කථාව

**ප.ව. 04.50** - ආදි ශිෂ්‍ය සංගමයේ ගරු ක්‍රියාකාරී සභාපතිතුමාගේ කථාව

**ප.ව. 04.55** - ප්‍රධාන ආරාධිත අමුත්තාගේ කථාව

**ප.ව. 05.00** - ජය සංකේත ප්‍රදානය

**ප.ව. 05.25** - ස්තුති කථාව (ප්‍රාධාන ශිෂ්‍ය නායක)

**ප.ව. 05.30** - සමාප්ති ප්‍රකාශනය

**ප.ව. 05.33** - ධජ පහත හෙළීම හා පසු බැසීමේ නළාහඬ

**ප.ව. 05.37** - ධජ භාරදීම

**ප.ව. 05.40** - පාසල් ගීතය

**ප.ව. 05.45** - සමාප්තිය

# නිලධාරී මණ්ඩලය 2025

**ප්‍රධාන තීරක** - ඩබ්.එම්.සී.කේ. මහමිතව මයා (විදුහල්පති)

**තීරකවරු** - බී.එම්.සී.එන්. කුලරත්න මිය (නි.වි)
- කේ.යූ. අලවත්තේගම මිය (නි.වි)
- එච්.එම්.කේ.ඩී. හේරත් මිය (නි.වි)
- ජී.එස්.කේ. ගොඩිගමුව මයා (නි.වි)
- එච්.එම්.යූ.එන්. ගුණතිලක මයා (නි.වි)
- ඒ.එච්.එන්.ඩී. ගුණදාස මිය (නි.වි)

**නියෝජ්‍ය විදුහල්පති ක්‍රීඩා හා විෂය සමගාමී**
- එච්.එම්.යූ.එන්. ගුණතිලක මයා (නි.වි)

**ක්‍රීඩා පාලක** - යූ.ජී.ඒ.එස්.පී. ගමගේ මයා

**විනිශ්ච මණ්ඩලය** - එස්.ආර්. ජයසිංහ මයා
- සුමේධ ජයසුන්දර මයා
- වරුණ ජයවර්ධන මයා
- කීර්ති ගුණසේකර මයා
- ඩී.ජේ. ධර්මසිරි මයා
- දමින්ද බණ්ඩාර මයා
- ඩබ්.එච්.යූ. බිම්සර මයා
- එච්.එම්.සී.ඒ. හේරත් මයා
- බී.සී.එස්. මෙන්ඩිස් මයා
- ඩබ්.ටී. මනෝජ් මයා
- රසික මානවඩුමයා

**කාල ගණන නිලධාරී** - දිනේෂ් බණ්ඩාර මයා
- පී.ඒ.කේ.එස්. කාංචන මයා

**ආරම්භක නිලධාරී** - නිරන්ජන් ලාල් කුමාර මයා
- රොහාන් බාලසූරිය මයා

**ආචාර පෙළපාලිය විනිශ්චය**

**අධීක්ෂණ** - ලුතිි/ කර්නල් ඒ.එම්.ඩී. අධිකාරි
(අණදෙන නිළධාරි - 4. ජා.ශි.බ)

| | | |
|---|---|---|
| **මණ්ඩලය** | - | මේජර් ප්‍රසන්න කලිකොටුව |
| | - | මේජර් සමන් සෙනවිරත්න |
| | - | මේජර් බුද්ධික හේමපාල |
| | - | මේජර් බන්දුල බණ්ඩාර |
| | - | මේජර් උපාලි ජයවර්ධන |

**පිටියේ පාලක ස්ථානය භාරව**

- මහේෂ් සිල්වා මයා
- ආර්.ඒ.අයි. අජිත් සිල්වා මයා

**ජය සංකේත ප්‍රධානය භාරව**

- බී.එම්.සී.එන්. කුලරත්න මිය (නි.වි)
- එච්.එම්.යූ.එන්. ගුණතිලක මයා (නි.වි)
- ආර්.එම්.එස්.ආර්. රත්නායක මයා
- එම්.කේ.එන්. ප්‍රියංගනී මිය
- ටී.වී.එච්.ඩී.එම්. නවරත්න මිය
- ජේ.එම්.එන්.ආර්. ජයසුන්දර මිය

**විනිශ්චය මණ්ඩලය භාරව**

- යූ.ජී.ඒ.එස්.පී. ගමගේ මයා

| | | |
|---|---|---|
| **කාර්යාල කටයුතු** | - | එම්.කේ.එන්. ප්‍රියංගනී මිය |
| | - | ජේ.එම්.එන්.එස්. ජයසුන්දර මිය |
| | - | බී.එම්.යූ. විජයනායක මිය |
| | - | ඒ.එම්.ඒ. ගුණරත්න මිය |
| **ක්‍රීඩා නායක** | - | ඒ.එම්.අයි.එම්. අලහකෝන් |
| **වෛද්‍ය නිලධාරීන්** | - | වෛද්‍ය මංජුල රූපසිංහ |
| | - | වෛද්‍ය ප්‍රසාද් රණතුංග |

# වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උළෙල සංදර්ශන සංවිධානය

- **ප්‍රාථමික අංශය මගින් ඉදිරිපත් කරන සංදර්ශන**

**සහභාගීත්වය**

1 ශ්‍රේණිය සහ 2 ශ්‍රේණි වල විවිධ ඇඳුම් සංදර්ශනය
3 ශ්‍රේණිය සහ 4 ශ්‍රේණි වල සමාරම්භක සංදර්ශනය

**උපදේශකත්වය සහ අධීක්ෂණය**

ඒ.එච්.එන්.ඩී. ගුණදාස මිය (නියෝජ්‍ය විදුහල්පති)
ඩබ්.එම්.එස්.බී. සෙනෙවිරත්න මයා (අංශ ප්‍රධාන ප්‍රාථමික)
ආර්.එම්.ඒ.කේ. දහනක මයා (නි. අංශ ප්‍රධාන ප්‍රාථමික)

**සංදර්ශන සිසුන් පුහුණු කිරීම හා මෙහෙයවීම**

1, 2, 3, 4 ශ්‍රේණි වල පංතිභාර ගුරු මහත්ම මහත්මීන්

- **කණිෂ්ඨ අංශය මගින් ඉදිරිපත් කරන සංදර්ශනය**

**සහභාගීත්වය**

6 ශ්‍රේණි සහ 7 ශ්‍රේණිවල සිසුන්

**උපදේශකත්වය සහ අධීක්ෂණය**

රත්නපුරේ ආනන්ද මෛත්‍රී හිමි (සහකාර විදුහල්පති)
එස්.එම්.සී. සත්කුමාර මිය (අංශ ප්‍රධාන)
ඒ.එම්. සෝමාවතී මිය (නි. අංශ ප්‍රධාන)

**සංදර්ශන නිර්මාණය**

එන්.එම්. චාන්දනී නරසිංහ මිය
ඒ.එස්.එස්. චාන්දනී අමරසිංහ මිය
එම්.ජේ.ජේ. නන්දසේන මයා

**සංදර්ශන සංගීත නිර්මාණය**

කේ.ඩී.බී. වීරසිංහ මයා

**සිසුන් පුහුණු කිරීම හා මෙහෙයවීම**

6 සහ 7 ශ්‍රේණි වල පංතිභාර ගුරු මහත්ම මහත්මීන් සහ කණිෂ්ඨ අංශයේ ගුරු මහත්ම මහත්මීන්

- **අපරදිග තූර්ය වාදක සංදර්ශනය උපදේශකත්වය හා අධීක්ෂණය**
  ආර්.එම්.ආර්.ඩී. රත්නායක මිය

- **පෙරදිග තූර්යවාදක සංදර්ශනය උපදේශකත්වය හා අධීක්ෂණය**
  කේ.පී.එස්. ප්‍රීති කුමාර් මයා

- **ශිෂ්‍යභට ඝන සරඹ සංදර්ශනය උපදේශකත්වය හා අධීක්ෂණය**
  මේජර් නිශාන්ත දොඹගහගේ මයා

## ගුරු හා ශිෂ්‍ය නිලධාරී මණ්ඩලය - තිස්ස නිවාසය




**නිවාස භාර අචාර්ය**
ටී.ජී. රුක්මන් සේනපාල මයා

**නියෝජ්‍ය නිවාස භාර ආචාර්ය**
ආර්.එම්.එච්.පී. කුමාර මයා

**නියෝජ්‍ය නිවාස භාර ආචාරිනී**
එම්.බී. නන්දසේන මිය

**භාණ්ඩාගාරික**
එච්.බී.කේ. ප්‍රේමරත්න මිය

### ශිෂ්‍ය නිළධාරීන්

| | | |
|---|---|---|
| නිවාස නායක | - | ඩබ්.එම්.ටී.එම්. බණ්ඩාර |
| උප නායක | - | ඩබ්.එම්.ඕ.පී.යූ. වන්නිනායක |
| උප නායක | - | එල්.එම්.එන්.එන්.බී. ලන්සකාර |
| උප නායක | - | ආර්.එම්.ආර්.ජේ. එදිරිසිංහ |
| ක්‍රීඩා නායක | - | එන්.එස්. කරුණාසිංහ |
| ක්‍රීඩා උප නායක | - | කේ.පී.පී.එම්. පටබැඳි |
| මළල ක්‍රීඩා නායක | - | බී.වී.එල්. ගීගනගේ |

### නිවාස කමිටු සාමාජික

කේ.එස්. මීගම
එම්.එච්.වී.ඩී. මුතුහරන
ජේ.එම්.සී.ඩී. අමරසිංහ
ඩී.එම්.කේ. වෙත්මික
එන්.ඩී.ඩී. ප්‍රනාන්දු

එච්.එම්.ටී.පී.බී. මොන්නැකුලම
ඩී.එම්.එල්.පී. දිසානායක
එම්.එස්.ජී.එම්. ද සිල්වා
වයි.එම්. සෙනෙවිරත්න
ඩබ්.එස්.එම්.ආර්. විජේසුන්දර

## තිස්ස නිවාසයේ උත්සව දින පැවැත්වෙන තරඟ සඳහා සහභාගීවන ක්‍රීඩකයින්

| ක්‍රීඩක අංකය | වයස් සීමාව | ඉසව්ව | ක්‍රීඩක නම |
|---|---|---|---|
| 01 | U-11 | 100 m | එන්.එච්.ඩී.වයි.ජ්. ද සිල්වා |
| 02 | U-11 | 100 m | එස්.එස්.බී.එම්.එස්.ටී. බණ්ඩාරනායක |
| 03 | U-11 | 100 m | කේ.එස්. තැන්නේගෙදර |
| 04 | U-12 | 100 m | එච්.ආර්.එම්.එම්.එන්. සුමනපාල |
| 05 | U-13 | 100 m | ඩී.ඩී. ජාසිංහ |
| 06 | U-13 | 100 m | කේ.එම්.එස්.ආර්. බණ්ඩාර |
| 07 | U-13 | 100 m | ඒ.එම්.ජී. රණතුංග |
| 08 | U-14 | 100 m | ජී.ටී.එම්. ප්‍රනාන්දු |
| 09 | U-14 | 100 m | කේ.එම්.ඕ.ඩී. කරුණානායක |
| 10 | U-15 | 200 m | බී.ඩී.එම්.එස්. ජයසූරිය |
| 11 | U-15 | 200 m | යූ.ආර්.ඩී.ටී. බණ්ඩාර |
| 12 | U-15 | 200 m | එස්.කේ.ඕ. ලක්ෂිත් |
| 13 | U-16 | 200 m | බී.එම්.බී.අයි.බී. මුණසිංහ |
| 14 | U-16 | 200 m | කේ.ඒ.වයි.ජී. කහඳවල |
| 15 | U-18 | 200 m | ඩබ්.ඒ.ඒ.ඒ. විජේසූරිය |
| 16 | U-18 | 200 m | ඒ.එම්.ජේ.එස්.බී. අබේකෝන් |
| 17 | U-20 | 100 m | ආර්.ඒ.ටී.ඩී. රූපසිංහ |
| 18 | U-20 | 100 m | බී.ඩබ්.එස්.එම්. බණ්ඩාර |
| 19 | U-20 | 100 m | එම්.ඩී.කේ.එම්. සිරිවර්ධන |

# ගුරු හා ශිෂ්‍ය නිලධාරී මණ්ඩලය - පරාක්‍රම නිවාසය




**නිවාස භාර අචාර්ය**
ජී.ජී.එන්.එන්. ආරියසිංහ මයා

**නියෝජ්‍ය නිවාස භාර ආචාර්ය**
ඊ.ඩී.පී.එම්. එදිරිමුණි මයා

**නියෝජ්‍ය නිවාස භාර ආචාරිනී**
ටී.එම්.එච්.කේ. තෙන්නකෝන් මිය

**භාණ්ඩාගාරික**
වයි.එම්.ජී. ප්‍රියදර්ශනී මිය

**ශිෂ්‍ය නිළධාරීන්**

නිවාස නායක - එම්.ඩී.සී.එස්. මානිංගමුව
උප නායක - එම්.එම්.බී.ඒ.බී. මාපා
උප නායක - එස්.එම්.ඩී.කේ.ඩී. ජයතිලක
උප නායක - ඩබ්.ඊ.එස්. කුමාරසිංහ
ක්‍රීඩා නායක - පී.ඩී.එච්.ඩබ්.ඒ. ප්‍රබෝධ
ක්‍රීඩා උප නායක - එම්.පී.එම්.වී. මීදෙනිය
මළල ක්‍රීඩා නායක - වී.පී. ගලප්පත්ති

**නිවාස කමිටු සාමාජික**

ආර්.එල්. රුකුනායක
ආර්.එම්.පී.ඩී. රාජපක්ෂ
ඩී.ජී.ටී.එල්. සිරිවර්ධන
පී.ඩබ්.ජී.එල්. අංජන
එම්.ඩී.ඩී.ඩී. දිසානායක
කේ.පී.එන්.වයි. කුමාරසිංහ
එච්.එන්.ටී.පී.එම්. හේරත්
ටී.එම්.එස්.ආර්.බී. තෙන්නකෝන්
වී.එස්. විතාරන
කේ.ඩී.එස්.එස්. ධර්මරත්න
කේ.පී.එස්.පී. කොඩිප්පිලි

## පරාක්‍රම නිවාසයේ උත්සව දින පැවැත්වෙන තරඟ සඳහා සහභාගීවන ක්‍රීඩකයින්

| ක්‍රීඩක අංකය | වයස් සීමාව | ඉසව්ව | ක්‍රීඩක නම |
|---|---|---|---|
| 54 | U-11 | 100 m | ආර්.එම්.බී.ඒ. දිසානායක |
| 55 | U-12 | 100 m | ඩී.එම්.එම්.එල්. දසනායක |
| 56 | U-13 | 100 m | ටී.එම්.කේ. තෙන්නකෝන් |
| 57 | U-13 | 100 m | ආර්.ඒ.එච්.එම්.එම්.ඩී.බී. අබේරත්න |
| 58 | U-14 | 100 m | ඩබ්.එම්.එස්.කේ. බණ්ඩාර |
| 59 | U-14 | 100 m | ඒ.ජී.අයි.එන්. දිසානායක |
| 60 | U-15 | 200 m | එම්.ඒ.වයි. ඉසුරංග |
| 61 | U-15 | 200 m | එච්.පී.ඩබ්.එල්. විජේසිරි |
| 62 | U-16 | 200 m | ඒ.ඩී.එම්. ගුණවර්ධන |
| 63 | U-18 | 200 m | කේ.කේ.එම්. චමල් |
| 64 | U-20 | 100 m | ඒ.එම්.අයි.එම්. අලහකෝන් |

## ගුරු හා ශිෂ්‍ය නිලධාරී මණ්ඩලය - ගැමුණු නිවාසය



**නිවාස භාර අචාර්ය**
එම්.ජී.ඒ.එස්. බාලසූරිය මයා

**නියෝජ්‍ය නිවාස භාර ආචාර්ය**
එච්.එම්.ඩී.ඒ.කේ. හේරත් මයා

**නියෝජ්‍ය නිවාස භාර ආචාරිනී**
එස්.ඒ.ටී. දිලානි මිය

**භාණ්ඩාගාරික**
ජේ.එම්.ඒ. ජයසිංහ මිය

**ශිෂ්‍ය නිළධාරීන්**

| | | |
|---|---|---|
| නිවාස නායක | - | එස්.එච්.එස්.ටී. සම්මාන |
| උප නායක | - | ඩී.කේ.එච්. පතිරන |
| උප නායක | - | ටී.ජී. වන්නිආරච්චි |
| උප නායක | - | ඒ.එස්.ඒ.යූ.අයි. අබේසිංහ |
| ක්‍රීඩා නායක | - | ඒ.එච්.ආර්. යසස්ති |
| ක්‍රීඩා උප නායක | - | ආර්.එම්.වයි.එම්. බණ්ඩාර |
| මළල ක්‍රීඩා නායක | - | ජී.සී.එස්. අමරසිංහ |

**නිවාස කමිටු සාමාජික**
කේ.ඒ.ටී.සී. අමරවික්‍රම
ජේ.එම්.කේ.සී. ජයසූරිය
එල්.එච්.එම්.එස්.පී. හේරත්
පී.එම්. එදිරිසිංහ
ආර්.එම්.අයි.බී. රාජගුරු
ඒ.අයි. විජේනායක
ආර්.එස්.ටී. පතිරණගේ
එච්.එම්.ආර්.අයි.එස්. ගුණතිලක
ඩබ්.එම්.ටී.ඩී. විජේසුන්දර
ඒ.එම්.ජේ.බී. අධිකාරි

## ගැමුණු නිවාසයේ උත්සව දින පැවැත්වෙන තරඟ සඳහා සහභාගීවන ක්‍රීඩකයින්

| ක්‍රීඩක අංකය | වයස් සීමාව | ඉසව්ව | ක්‍රීඩක නම |
|---|---|---|---|
| 20 | U-11 | 100 m | ඩබ්.එම්.අයි.බී. වීරසේකර |
| 21 | U-11 | 100 m | ඩබ්.එම්.එම්.ජේ. බණ්ඩාර |
| 22 | U-11 | 100 m | ඩබ්.කේ.ඩී.එස්. කලාවිට |
| 23 | U-12 | 100 m | වී.ජේ.එන්.කේ. සෙනවිරත්න |
| 24 | U-12 | 100 m | එච්.කේ.ආර්.අයි. අරෝෂණ |
| 25 | U-12 | 100 m | ආර්.එම්.ඩී.එම්. රණවිල |
| 26 | U-13 | 100 m | එච්.එම්.එස්.එස්. රණතුංග |
| 27 | U-13 | 100 m | ඩී.එච්.වයි.එන්. පෙරේරා |
| 28 | U-14 | 100 m | කේ.ජී.වයි. නිමාජිත් |
| 29 | U-14 | 100 m | ඒ.ඩී.එස්.ඩබ්. රත්නප්‍රිය |
| 30 | U-14 | 100 m | කේ.එම්.ජී. කරුණාසිංහ |
| 31 | U-15 | 200 m | ඒ.එම්.එන්. පුන්සර |
| 32 | U-16 | 200 m | එස්.ඩී.ඒ. සියඹලාපිටිය |
| 33 | U-16 | 200 m | සී.එම්.ඒ.ඒ. චන්ද්‍රසේකර |
| 34 | U-16 | 200 m | ඊ.පී.එම්. ගුණතිලක |
| 35 | U-18 | 200 m | ටී.එම්.එස්.එස්. කරුණාරත්න |
| 36 | U-18 | 200 m | ජේ.ඒ.ආර්.ජී. සහසත් |
| 37 | U-20 | 100 m | එච්.ඒ.එම්.ඩී. හෙට්ටිආරච්චි |
| 38 | U-20 | 100 m | ඩබ්.ජී.ජේ. වරාපිටිය |

## ගුරු හා ශිෂ්‍ය නිලධාරී මණ්ඩලය - රාජසිංහ නිවාසය



**නිවාස භාර අචාර්ය**
ආර්.අයි.බී.පී.කේ. රත්නමලල මයා

**නියෝජ්‍ය නිවාස භාර ආචාරිනී**
ජේ.එල්.එච්.එස්. ජයසිංහ මිය

**නියෝජ්‍ය නිවාස භාර ආචාර්ය**
යූ. පරාස් මයා

**භාණ්ඩාගාරික**
එච්.එම්.අයි. ප්‍රේමවංශ මිය

**ශිෂ්‍ය නිළධාරීන්**

නිවාස නායක - එන්.එස්. කරුණාසිංහ
උප නායක - ජී.ඩී.ආර්.ටී. නිකු
උප නායක - ඩී.එම්.ටී.එස්. දිසානායක
උප නායක - කේ.ඒ.ඩී. පන්සිළු
ක්‍රීඩා නායක - යූ.ඩබ්.එන්.සී. සරච්චන්ද්‍ර
ක්‍රීඩා උප නායක - එස්.පී.පී.සී. හේමසිරි
මළල ක්‍රීඩා නායක - බී.එල්.එන්. මනෝද්‍ය

**නිවාස කමිටු සාමාජික**

ඩබ්.ටී.එස්. වීරසිංහ
කේ.ඒ.පී.එන්.බී. කුරුප්පු
එච්.එම්.ටී. දිසානායක
ඩී.එම්.එම්.ඩී. දිසානායක
පී.එම්.බී.ඩබ්. ගුණවර්ධන
වී.ජී.ජී.එස්. සිල්වා
ජේ.එම්.එස්.ජේ. ජයවර්ධන
ටී.ඩබ්.අයි. තේජන
ඒ.එම්.කේ.ජී. මුණසිංහ
එම්.ඒ.කේ. මිහිරංග

## රාජසිංහ නිවාසයේ උත්සව දින පැවැත්වෙන තරඟ සඳහා සහභාගීවන ක්‍රීඩකයින්

| ක්‍රීඩක අංකය | වයස් සීමාව | ඉසව්ව | ක්‍රීඩක නම |
|---|---|---|---|
| 39 | U-11 | 100 m | ඩබ්.එම්.බී. වික්‍රමසිංහ |
| 40 | U-12 | 100 m | ඩබ්.ඒ.එම්.වයි.බී. වීරසූරිය |
| 41 | U-12 | 100 m | ඩී.ඩී.අයි.එම්. වික්‍රමරත්න |
| 42 | U-12 | 100 m | ඩබ්.එම්.අයි.ඒ. විජේකෝන් |
| 43 | U-13 | 100 m | ආර්.එම්.එස්.ඩබ්. ප්‍රේමරත්න |
| 44 | U-14 | 100 m | ආර්.එම්.වී.එච්. රණවිල |
| 45 | U-15 | 200 m | ඩබ්.එම්.වයි.එන්. වර්ණසූරිය |
| 46 | U-15 | 200 m | ඩී.එම්.ටී.ආර්. දිසානායක |
| 47 | U-16 | 200 m | එච්.එම්.බී.පී. හේරත් |
| 48 | U-16 | 200 m | එස්.ඩී.එන්. බුද්ධික |
| 49 | U-18 | 200 m | එන්.ඒ.කේ.පී. ජයරත්න |
| 50 | U-18 | 200 m | ඩබ්.පී.එච්. වික්‍රමසිංහ |
| 51 | U-18 | 200 m | ආර්.එම්.ජේ.එල්. රත්නායක |
| 52 | U-20 | 100 m | එම්.ඒ.කේ. මිහිරංග |
| 53 | U-20 | 100 m | ඒ.එම්.කේ.ජී. මුණසිංහ |
| 35 | U-18 | 200 m | ටී.එම්.එස්.එස්. කරුණාරත්න |
| 36 | U-18 | 200 m | ජේ.ඒ.ආර්.ජී. සහසත් |
| 37 | U-20 | 100 m | එච්.ඒ.එම්.ඩී. හෙට්ටිආරච්චි |
| 38 | U-20 | 100 m | ඩබ්.ජී.ජේ. වරාපිටිය |

## මළල ක්‍රීඩා වාර්තා

| ඉසව්ව | ක්‍රීඩක නම | දක්ෂතාව | නිවාසය | වර්ෂය |
|---|---|---|---|---|
| 100M | ඩබ්.ඩී.සී.එන්. පියසිරි | 11.10 | පරාක්‍රම නිවාසය | 2019 |
| 200M | පී.එම්.පී.එල්. කොඩිකාර | 21.25 | පරාක්‍රම නිවාසය | 2018 |
| 400M | පී.එම්.පී.එල්. කොඩිකාර | 49.73 | පරාක්‍රම නිවාසය | 2017 |
| 800M | එස්.බී.එම්.වී.පී. බණ්ඩාර | 2.07 | ගැමුණු නිවාසය | 2016 |
| 1500M | එස්.බී. අබේසිංහ | 4.36 | තිස්ස නිවාසය | 1988 |
| 5000M | ඩබ්.ඒ.ආර්.ජේ. වනිගසේකර | 19.05 | ගැමුණු නිවාසය | 2017 |
| 10000M | එස්.එම්.එස්.කේ. අතපත්තු | 29.30 | රාජසිංහ නිවාසය | 2004 |
| උස පැනීම | පී.එම්.පී.එල්. කොඩිකාර | 1.81 | පරාක්‍රම නිවාසය | 2014 |
| දුර පැනීම | ඩබ්.ඒ.එච්.ජේ.ඒ. වංශතිලක | 6.82 | රාජසිංහ නිවාසය | 2024 |
| තුන් පිම්ම | ටී.එම්.ඩී. තෙන්නකෝන් | 14.39 | පරාක්‍රම නිවාසය | 2017 |
| යගුලිය | යූ.ඩී. ආරියතිලක | 12.81 | ගැමුණු නිවාසය | 2003 |
| කවපෙත්ත | කේ.බී. ඒකනායක | 36.69 | රාජසිංහ නිවාසය | 2005 |
| හෙල්ල | ආර්.ඩී.අයි.එල්. ජයරත්න | 52.19 | තිස්ස නිවාසය | 2020 |
| පාපැදි | එස්.ඩී. කහදවආරච්චි | 1.24.03 | ගැමුණු නිවාසය | 2004 |
| මාර්ග ධාවන | යූ. හේරත් | 25.50 | රාජසිංහ නිවාසය | 1984 |

**මලල ක්‍රීඩා**

2024 වර්ෂය මලල ක්‍රීඩාවේ ජයග්‍රහණ රැසක් සමගින් නව පිබිදීමක් ඇති වූ වර්ෂයකි.

- 2024 කලාප මලල ක්‍රීඩා තරගාවලියේදී සමස්ත ශූරතාවය දිනාගැනීමට සමත් විය.
- 2024 වයඹ පළාත් මලල ක්‍රීඩා තරගාවලියේදී පදක්කම් 24 ක් දිනාගනිමින් සමස්ත බාලක අනුශූරතාවය දිනාගැනීමට සමත්විය.
- 2024 වර්ෂයේ පැවති 53වැනි ජෝන් ටාබට් කණිෂ්ඨ මලල ක්‍රීඩා සමස්ත ලංකා තරගාවලියේදී පරිසාදන මට්ටම ඉක්මවූ මලල ක්‍රීඩකයන් 07 කි.
- 2024 පැවති ජෝන් ටාබට් ජ්‍යෙෂ්ඨ සමස්ත ලංකා තරගාවලියේදී පහත ජයග්‍රහණයන් සමග වර්ණ දිනාගන්නා ලදී.

  ★ **අවු. 16න් පහල**

  ආර්.ජී.සී.එල්. ආරියරත්න - 400m කඩුළු - 6 වන ස්ථානය - වර්ණ

  එම්.එස්.එස්. කරුණාරත්න - 100m කඩුළු - 7 වන ස්ථානය - වර්ණ

  ★ **අවු. 20න් පහල**

  අයි.එම්.ඒ.ආර්.කේ. වීරසේන - යගුලිය දැමීම, 3 වන ස්ථානය - වර්ණ

- 2024 කණිෂ්ඨ මලල ක්‍රීඩා ශූරතා සමස්ත ලංකා තරගාවලියේදී පහත ජයග්‍රහණයන් ලබාගන්නා ලදී.

  ★ **අවු. 20න් පහල**

  වී.පී. ගලප්පත්ති - කවපෙත්ත විසිකිරීම, 3 වන ස්ථානය

  අයි.එම්.ඒ.ආර්.කේ. වීරසේන - යගුලිය දැමීම, 3 වන ස්ථානය

- 2024 ජාතික පාසල් සමස්ත ලංකා තරගාවලියේදී පහත ජයග්‍රහණයන් ලබාගන්නා ලදී.

  ★ **අවු. 20න් පහල**

  වී.පී. ගලප්පත්ති - කවපෙත්ත විසිකිරීම, දෙවන ස්ථානය
  දක්ෂතාවය : 40.27m, වර්ණ සහිතව

  අයි.එම්.ඒ.ආර්.කේ. වීරසේන - යගුලිය දැමීම, තෙවන ස්ථානය
  දක්ෂතාවය : 14.31m, වර්ණ සහිතව

  ★ **අවු. 16න් පහල**

  ආර්.ජී. චේනුල ලක්මින් - 300m කඩුළු, 4වන ස්ථානය

  ★ **අවු. 14න් පහල**

  එච්.ඒ.ඩී.එස්. හපුආරච්චි - 80m කඩුළු - 5 වන ස්ථානය
  එච්.පී.ඩබ්.එල්. විජේසිරි - 60m - 7 වන ස්ථානය

## බැඩ්මින්ටන්

මලියදෙව විද්‍යාලයීය බැඩ්මින්ටන් ක්‍රීඩකයින් පහත ජයග්‍රහණ ලබාගෙන ඇත.

- 2024 වයඹ පළාත් බැඩ්මින්ටන් තරඟාවලිය
  - ★ 16න් පහළ කණ්ඩායම - ප්‍රථම ස්ථානය
  - ★ 18න් පහළ කණ්ඩායම - දෙවන ස්ථානය
  - ★ 20න් පහළ කණ්ඩායම - ප්‍රථම ස්ථානය
- 2024 සමස්ත ලංකා පාසල් වයස අවු. 11න් පහළ යුගල බැඩ්මින්ටන් තරගාවලියේ B කාණ්ඩයේ අනුශූරතාවය දිනාගන්නා ලදී.

## ටෙනිස් ක්‍රීඩාව

මලියදෙව විද්‍යාලයීය ටෙනිස් ක්‍රීඩකයින් පහත ජයග්‍රහණ ලබාගෙන ඇත.

- 2024 ශ්‍රී ලංකා පාසල් ටෙනිස් සංගමය විසින් පවත්වන ලද සමස්ත ලංකා අන්තර් පාසල් ටෙනිස් තරගාවලියේදී පහත ජයග්‍රහණ හිමිකරගෙන ඇත.
  - ★ **අවු. 13න් පහළ**

    දෙවන කාණ්ඩය - කුසලාන - දෙවන ස්ථානය
  - ★ **අවු. 15න් පහළ**

    මලියදෙව විද්‍යාලයීය ටෙනිස් ක්‍රීඩා ඉතිහාසයේ ප්‍රථම වරට පළමු පෙළ ටෙනිස් ශූරතාවයක් දිනාගැනීමට සමත්විය

    පළමු කාණ්ඩය - කුසලාන - ශූරතාවය
  - ★ **අවු. 17න් පහළ**

    පළමු කාණ්ඩය - කුසලාන - තෙවන ස්ථානය
  - ★ **අවු. 19න් පහළ**

    දෙවන කාණ්ඩය - පළිහ - දෙවන ස්ථානය
- ශ්‍රී ලංකා ටෙනිස් සංගමයේ ජාතික ශ්‍රේණිගත කිරීම් තේරීම් අනුව අවු. 12න් පහළ ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කරමින් නේපාලයේ පැවති දකුණු ආසියාතික තරගාවලිය සඳහා ජේ.එම්.බී.ආර්.බී. ජයවර්ධන ක්‍රීඩකයා සහභාගී විය.

## චෙස් ක්‍රීඩාව

මලියදෙව විද්‍යාලය තුළ චෙස් ක්‍රීඩාව ඉතාමත් ජනප්‍රිය ක්‍රීඩාවක් වන අතර ජාත්‍යන්තර ජයග්‍රහණයන් ලබාගැනීමට ක්‍රීඩකයන් සමත් වී ඇත.

- 2024 සමස්ත ලංකා පළාත් චෙස් තරගාවලිය

  අවු. 17න් පහළ කණ්ඩායම - ශූරතාවය - පුවරු ත්‍යාගය

  අවු. 20න් පහළ කණ්ඩායම - ශූරතාවය - පුවරු ත්‍යාගය

- ශ්‍රී ලංකා පාසල් කේවල චෙස් තරගාවලියේ අවසන් වටයේදී ජයග්‍රහණ ලැබූ ක්‍රීඩකයන් ආසියානු චෙස් තරගාවලිය සඳහා සහභාගී වීම විද්‍යාලයට ඉමහත් කීර්තියකි.
- 2024 සමස්ත ලංකා පාසල් කණ්ඩායම් චෙස් තරගාවලියෙන්,
  - ★ අවු. 11න් පහල ශූරතාවය ද,
  - ★ අවු. 17න් පහල ශූරතාවය ද,
  - ★ අවු. 9න් පහල අනුශූරතාවය ද,
  - ★ අවු. 15න් පහල අනුශූරතාවය ද,
  - ★ අවු. 11න් පහල හා 20න් පහල කුසලතා සහතිකයක් ද දිනා ගැනීමට සමත් විය.

**වායු රයිෆල් වෙඩි තැබීමේ ක්‍රීඩාව**

වායු රයිෆල් වෙඩි තැබීමේ ක්‍රීඩාව මලියදේව විද්‍යාලයේ ඉතාමත් ජනප්‍රිය ක්‍රීඩාවකි. ක්‍රීඩකයන් 200 ඉක්මවා ක්‍රීඩාවේ නිරත වේ. 2024 වර්ෂයේදී වයඹ පළාත් මටට්මින් පහත ජයග්‍රහණ හිමිකරගන්නා ලදී.

- Break Barreal Rifle ඉසව්වෙන් නිපුන වෙඩික්කරු (Sharp Shooter) ජයග්‍රහණ 47ක් ලබාගැනීම
- PCP Rifle ඉසව්වෙන් නිපුන වෙඩික්කරු (Sharp Shoter) ජයග්‍රහණ 07 ක් ලබා ගැනීම
- 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා පාසල් වෙඩි තැබීමේ සංගමය විසින් පවත්වන ලද සමස්ත ලංකා තරගාවලියේදී පහත ජයග්‍රහණයන් දිනාගන්නා ලදී.
  - ★ PCP Pistol අංශයෙන් සමස්ත ලංකා ප්‍රථම ස්ථානය
  - ★ PCP Rifle අංශයෙන් හතරවන ස්ථානය
  - ★ B.B. Rifle ජ්‍යෙෂ්ඨ අංශයෙන් නිපුන වෙඩික්කරු ජයග්‍රහණ 02ක් දිනාගන්නා ලදී.
  - ★ B.B. Rifle ආධුනික අංශයෙන් නිපුන වෙඩික්කරු ජයග්‍රහණ 13ක් දිනාගන්නා ලදී.

**ජිම්නාස්ටික් ක්‍රීඩාව**

- 2024 වයඹ පළාත් ජිම්නාස්ටික් තරගාවලියේදී වයඹ පළාත් ශූරතාවය දිනා ගනිමින්, පහත ජයග්‍රහණයෙන් දිනා ගැනීමට සමත් විය.
  - ★ අවු. 20න් පහළ දක්ෂතම ක්‍රීඩකයා - වී.සී.බී. දිසානායක
  - ★ සමස්ත තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා - වී.සී.බී. දිසානායක
  - ★ මෙම තරගාවලියේදී රන්පදක්කම් 11ක්, රිදී පදක්කම් 8ක්, ලෝකඩ පදක්කම් 4ක් දිනා ගැනීමට සමත් විය.

- 48 වන ජාතික මහා ක්‍රීඩා උළෙලට අදාළව පවත්වනු ලැබූ පළාත් තරගාවලියේදී වී.සී.බී. දිසානායක ක්‍රීඩකයා රිදී පදක්කමක් සහ ලෝකඩ පදක්කම් දෙකක් දිනාගන්නා ලදී.

**මේසපන්දු ක්‍රීඩාව**

- 2024 වර්ෂයේ සියලුම වයස් කාණ්ඩයන්ගෙන් වයඹ පළාත් ශූරතාවයන් දිනා ගැනීමට සමත් විය.
- වයස අවුරුදු දහයෙන් පහළ සමස්ත ලංකා ශූරතාවය දිනා ගැනීමට සමත් විය
- 2024 වර්ෂයේ දී ජාතික කනිෂ්ඨ මේස පන්දු තරගාවලියේදී අමිල උදාර ක්‍රීඩකයා වයස අවුරුදු 19 න් පහළ අනුශූරතාවය දිනා ගැනීම.
